අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல / My Ref } ED/1/10/01/170 ඔබේ අංකය / உமது இல / Your Ref. } දිනය / திகதி / Date } 2018. 06 . 20

චක්‍රලේඛ අංක - 17/2018

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල කළමනාකරුවන්/විදුහල්පතිවරුන් වෙත.

**<u>රජයේ අනුමත පෞද්ගලික පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්යය මණ්ඩලය නිර්ණය කිරීම.</u>**

1. රජයේ අනුමත පෞද්ගලික පාසල් (ආධාර ලබන/නොලබන) පෞද්ගලික කළමනාකාරීත්වය යටතේ රජයේ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව ක්‍රියාත්මක වේ. මෙම පාසල් සඳහා රජය විසින් විවිධ අනුග්‍රහයන් ලබා දෙනු ලබයි. රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට හිමි නියමිත ගුරු සේවක සංඛ්‍යාව ගණනය කිරීමෙන් පසුව එම සංඛ්‍යාවට අදාළව ගුරුපත්වීම් අනුමත කරනු ලබන අතර, ඔවුන් පාඨශාලා දායක ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය හා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා හිමිකම ලබයි. ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන්ට රජය විසින් ගුරු වැටුප් සඳහා ආධාර ද ලබා දෙයි.

2. අනුමත පෞද්ගලික පාසල්වල ගුරු සේවක සංඛ්‍යාව නිර්ණය කිරීම 2018 වර්ෂය දක්වා සිදු කරනු ලබන්නේ 1997.04.08 දිනැති අංක 1997/04 චක්‍රලේඛය හා එම චක්‍රලේඛයේ සංශෝධනයක් ලෙස නිකුත්කළ 1998.03.11 දිනැති අංක 1998/09 චක්‍රලේඛය අනුවය. 2019 වර්ෂය සඳහා හා ඉන් ඉදිරියට ගුරු සේවක සංඛ්‍යාව ගණනය කිරීමේ දී පහත කොන්දේසිවලට අනුකූලව අධ්‍යාපන අමාත්‍යාංශයේ 2016.01.07 දිනැති අංක 1/2016 චක්‍රලේඛය යොදා ගත යුතුය. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ආයතනික හා පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛවල හා උපදෙස් ලිපිවල ගුරු සේවක සංඛ්‍යාව ගණනය කිරීම සඳහා 1997/04 චක්‍රලේඛය අදාළ කර ගන්නා ලෙස සඳහන් කර ඇති අවස්ථාවන්හි දී, ඒ වෙනුවට 1/2016 චක්‍රලේඛය, මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව යොදාගත යුතුය.

3. කොන්දේසි

3.1 රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු සේවක සංඛ්‍යා ගණනය, වාර්ෂිකව අනුමත කරවා ගත යුතුය. සෑම වසරකම දෙසැම්බර් 31 දිනට පෙර එම වසරේ ජූනි 01 වන දාට පවතින පංති සංඛ්‍යාව සහ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන, ඊළඟ වර්ෂයට අදාළ ගුරු සේවක සංඛ්‍යාව ගණනය කර එම ගුරු සේවක සංඛ්‍යා ගණනය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමත කර ගත යුතුය. එමනිසා වාර්ෂිකව අදාළ වර්ෂයේ අගෝස්තු 30 වන විට පාසල මගින් මෙම තොරතුරු කලාප අධ්‍යාපන කාර්යාලයට ලබා දීමට කටයුතු කළ යුතුය.

3.2 මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක 1/2016 චක්‍රලේඛයේ 07,08,09 වගන්ති හා උප වගන්ති රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා අදාළ නොවේ.

3.3 ඉහත 3.2 හි සඳහන් 1/2016 චක්‍රලේඛයට අනුව නියමිත ගුරු සේවක සංඛ්‍යාව ගණනය කිරීමේ දී එම සංඛ්‍යාව 1997/04 චක්‍රලේඛයට අනුව ගණනය කරන ලද සංඛ්‍යාවට වඩා අඩු

හෝ වැඩි විය හැකිය. 1997/04 චක්‍රලේඛයට අනුව අනුමත වූ ගුරු සේවක සංඛ්‍යාව තුළ බඳවාගෙන ඇති අනුමත පත්වීම්ධාරීන් සංඛ්‍යාව, මෙම චක්‍රලේඛය මඟින් අනුමත වූ ගුරු සේවක සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම්, එලෙස වැඩියෙන් සිටින ගුරුවරුන් අවුරුදු 02ක් ඇතුළත තුලනය කර ගත යුතුය. මෙම පරිවර්තීත කාලය තුළ ගුරු තුලනය සිදු වන තෙක් නව පත්වීම් අනුමත කරනු නොලැබේ.

3.4 ඉහත 3.3 හි සඳහන් අවුරුදු 02 ක පරිවර්තීත කාලය තුළ අතිරික්තව සිටින ගුරුවරුන් තුලනය කර ගැනීමට නොහැකි වුවහොත් ගුරුවරුන්ගේ පත්වීම් ලිපියේ සඳහන් පරිදි කළමනාකාරීත්වය විසින් අතිරික්ත වූ ගුරුවරුන්, විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර සේවයෙන් ඉවත් කිරීමට පාසල් කළමනාකාරීත්වය විසින් කටයුතු කළ යුතුය.

3.5 පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව රජයේ පාසල්වලට අදාළ චක්‍රලේඛවලට අනුව සිටියු යුතු ශිෂ්‍ය සංඛ්‍යාවට සමාන්තර විය යුතුය. එහෙත් එක් ශ්‍රේණියක එක් පන්තියක් පමණක් පවත්වාගෙන යන පාසල් සඳහා එක් පන්තියක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 15 ට වඩා අඩු වන අවස්ථාවන්හිදී එම සංඛ්‍යාව අවුරුදු දෙකක කාලයක් තුළ වර්ධනය කර ගැනීමට හැකි බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට හැඟී යන්නේ නම්, ඔහු/ඇය ඒ පිළිබඳ නිර්දේශයක් දීමෙන් පසු අදාළ වර්ෂය සඳහා ගුරුසේවක සංඛ්‍යාව අනුමත කරනු ලැබේ. එසේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය නොලැබෙන්නේ නම්, ශිෂ්‍ය සංඛ්‍යාව 15ට අඩුවෙන් සිටින පංති සියල්ලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කර, සිසුන් 15 දෙනකුට එක් ගුරුවරයෙකු බැගින් ලබා දෙනු ඇත.

3.6 ඉහත සඳහන් 1/2016 චක්‍රලේඛයේ උපලේඛන (i) හි අංක 7 "ආගම් විෂය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව" යටතේ දක්වා ඇති වගුවේ "4 සිට 240 දක්වා සිසුන් සඳහා වෙනත් පාසලක් සමඟ ඒකාබද්ධව පාසල් දෙකම සඳහා ගුරුවරයෙකු ලබා දිය හැකිය" යනුවෙන් සඳහන් කර ඇති වගන්තිය, රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා අදාළ නොවේ. ඒ සඳහා අදාළ පාසල මඟින් තම පාසලට ගුරුවරයෙකු සපයා ගත යුතු වේ.

3.7 අ.පො.ස.(උසස් පෙළ) පන්ති සඳහා ගුරුවරුන් ගණනය කිරීමේදී, අදාල ගුරු සේවක සංඛ්‍යාව ගණනය කිරීමේ වර්ෂයට පෙර වර්ෂයේ ජූනි 01 වන දා වන විට 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගෙන ඇත්නම්, එම ගණන් කිරීමේ වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින පන්ති සඳහා ගුරුවරුන් ලබා නොදේ.

3.8 රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ද ගුරු ගණනය කිරීම මින් ඉදිරියට සිදු කරන්නේ පංති සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වන බැවින් පන්ති සංඛ්‍යාව වැඩි කරන්නේ නම් ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යක්ෂක වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතුය. එසේ අනුමැතියකින් තොරව පන්ති ආරම්භ කර ගුරු ගණනය අනුමත කිරීම සඳහා ඉදිරිපත් කළහොත් ඒ සඳහා අනුමැතිය ලබා දෙනු නොලැබේ.

3.9 ඉහත 1/2016 චක්‍රලේඛයේ (ii) උපලේඛනය පෞද්ගලික පාසල්වලට අදාළ නොවන අතර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන (ii) හා උපලේඛන (iii) භාවිතා කළ යුතුය.

3.10 ඉහත කී 1/2016 චක්‍රලේඛයේ (i) වන උපලේඛනයේ 15 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"15. සෑම රජයේ අනුමත පෞද්ලික පාසලකටම එක් විදුහල්පතිවරයෙකු සිටිය යුතුය."

4 එක් එක් පෞද්ගලික පාසලේ මෙම කොන්දේසිවලට යටත්ව 1/2016 චක්‍රලේඛයට අනුව සකසන ලද ගුරු සේවක සංඛ්‍යා ගණනය කළමණාකරු/විදුහල්පතිවරයා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තම නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමුකොට අනුමැතිය ලබා ගත යුතුය.

5 මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු සම්බන්ධයෙන් අවසාන තීරණය ලබා දීමේ බලය අධ්‍යාපන ලේකම් සතුය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

01. විගණකාධිපති.
02. සභාපති - ජාතික අධ්‍යාපන කොමිසම
03. විභාග කොමසාරිස් ජනරාල්
04. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
05. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

## උපලේඛන (ii)

## ................. වර්ෂය සඳහා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල (ආධාර ලබන/නොලබන) අධ්‍යයන කාර්ය මණ්ඩලය ගණනය කිරීම

## (පෙර වර්ෂයේ ජුනි 01 දිනට අදාළ දත්ත අනුව)

**මාධ්‍යය...................**

01. පාසලේ නම :-
02. ලිපිනය :-
03. පළාත :-
04. කලාපය :-
05. කොට්ඨාශය :-
06. පාසලේ සංගණන අංකය :- | | | | | |
07. ශිෂ්‍ය සංඛ්‍යාව හා පන්ති සංඛ්‍යාව:-

| අංශය | ශිෂ්‍ය සංඛ්‍යාව | පංති සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාථමික (1-5) | | |
| ද්විතීයික (6-11) | | |
| උසස් පෙළ (12-13) විද්‍යා අංශය | | |
| උසස් පෙළ (12-13) තාක්ෂණ අංශය | | |
| උසස් පෙළ (12-13) කලා/වාණිජ | | |
| විශේෂ අධ්‍යාපන | | |
| එකතුව | | |

08. සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව හා සිටින ගුරුවරුන් සංඛ්‍යාව

| ගුරු විෂය වර්ගය | | | 17/2018 චක්‍රලේඛය අනුව සිටිය යුතු ගුරු සේවක සංඛ්‍යාව | දැනට යෝජනා පත්‍ර අනුමත කරගෙන සිටින ගුරු සේවක සංඛ්‍යාව | තවදුරටත් යෝජනා පත්‍ර අනුමත කර ගත හැකිව තිබෙන ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප්‍රාථමික අංශය (1-5) | 8.1 | ප්‍රාථමික පොදු | | | |
| | 8.2 | ඉංග්‍රීසි | | | |
| | 8.3 | දෙවන ජාතික භාෂාව (දෙමළ හෝ සිංහල) | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ද්විතීයික අංශය (6-11) | 8.4 | විද්‍යාව | | | |
| | 8.5 | ගණිතය | | | |
| | 8.6 | මව්බස (සිංහල/දෙමළ) | | | |
| | 8.7 | ඉංග්‍රීසි | | | |
| | 8.8 | ඉතිහාසය | | | |
| | 8.9 | ආගම (බෞද්ධ/හින්දු/ ඉස්ලාම්/ රෝමානු කතෝලික /ක්‍රිස්තියානි) | | | |
| | 8.10 | බහුතරය නොවන ආගම් විෂයය (................................) | | | |
| | | (..............................) | | | |
| | | (..............................) | | | |
| | | | | | |
| | 8.11 | පළමු කාණ්ඩයේ විෂයයන් සඳහා | | | |
| | 8.12 | දෙවන කාණ්ඩයේ විෂයයන් සඳහා | | | |
| | 8.13 | තෙවන කාණ්ඩයේ විෂයයන් සඳහා | | | |
| අ.පො.ස. උසස් පෙළ (12-13) | 8.14 | විද්‍යා අංශය (ප්‍රධාන විෂයයන්) | | | |
| | 8.15 | තාක්ෂණවේදය අංශය (ප්‍රධාන විෂයයන්) | | | |
| | 8.16 | කලා/වාණිජ අංශය (ප්‍රධාන විෂයයන්) | | | |
| | 8.17 | උසස් පෙළ GIT (අතිරේක විෂය) | | | |
| | 8.18 | උසස් පෙළ ඉංග්‍රීසි (අතිරේක විෂය) | | | |
| පොදු | 8.19 | ශිෂ්‍ය උපදේශන කාර්යයේ නියුතු ගුරුවරුන් | | | |
| | 8.20 | පුස්තකාල කටයුතු භාර ගුරුවරුන් | | | |
| | 8.21 | I C T ගුරුවරුන් | | | |
| | 8.22 | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් | | | |
| | 8.23 | ද්විතීයික අංශය සඳහා (6-11) අධීක්ෂක ගුරුවරුන් | | | |
| | 8.24 | උසස් පෙළ සඳහා අධීක්ෂණ ගුරුවරුන් | | | |
| | | එකතුව | | | |

09. විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පතිවරුන් /සහකාර විදුහල්පතිවරුන් සංඛ්‍යාව

| | වර්ගය | 17/2018 චක්‍රලේඛය අනුව සිටිය යුතු ගුරු සේවක සංඛ්‍යාව | දැනට යෝජනා පත්‍ර අනුමත කරගෙන සිටින ගුරු සේවක සංඛ්‍යාව | තවදුරටත් යෝජනා පත්‍ර අනුමත කර ගත හැකිව තිබෙන ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 9.1 | සහකාර විදුහල්පතිවරු | | | |
| 9.2 | නියෝජ්‍ය විදුහල්පතිවරු | | | |
| 9.3 | විදුහල්පති | | | |

ඉහත සඳහන් ශිෂ්‍ය සංඛ්‍යාව හා පන්ති සංඛ්‍යාව නිවැරදි බවත්, එම පන්ති සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව පාදක කොට ගෙන අධ්‍යාපන ලේකම්ගේ අංක 17/2018. චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගුරු සංඛ්‍යාව ගණනය කර ඇති බවත් සහතික කරමි.

දිනය :...........................

.........................................

කළමනාකරු/විදුහල්පතිගේ අත්සන
නම :-
නිල මුද්‍රාව :-

<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය</u>

................................................................ විද්‍යාලයේ විදුහල්පති / කළමනාකරු ඉදිරිපත් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව, පන්ති සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම සංඛ්‍යා අධ්‍යාපන ලේකම්ගේ අංක 17/2018 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව නිවැරදි බවත්/සංශෝධනය කර නිවැරදි කර ඇති බවත්, සිටිය යුතු ගුරු මණ්ඩලය ගණනය කිරීම නිවැරදි බවත්, සහතික කර, /නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :...........................

...............................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
නම :-
නිල මුද්‍රාව :-

<u>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ :-</u>

......................................................... කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මා වෙත එවා ඇති ............................................................... විද්‍යාලයේ ගුරු සංඛ්‍යා තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 17/2018 චක්‍රලේඛයට අනුව ගණනය කර ඇති අතර, එම ගුරු සංඛ්‍යාව නිවැරදි බවත් ඒ අනුව එම විද්‍යාලයට හිමි විදුහල්පති ඇතුළු සිටිය යුතු ගුරු සංඛ්‍යාව .................... බවත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය ............................

........................................................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
නම :-
නිල මුද්‍රාව :-

ඉහත ගුරු සංඛ්‍යාව අනුමත කරමි./ සංශෝධනය කර අනුමත කරමි. /අනුමත නොකරමි.

......................................................................................................................................................

......................................................................................................................................................

............................................................................................................................................

දිනය - ................

.................................
අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
(පෞද්ගලික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
නම -
නිල මුද්‍රාව -

## උපලේඛන (III)

................ වර්ෂයේ ජුනි 01 වන දිනට පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව හා වෙනත් තොරතුරු

01. පන්ති අනුව ශිෂ්‍ය සංඛ්‍යාව

| ශ්‍රේණිය | | ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| ශ්‍රේණිය | පංතිය | පිරිමි | ගැහැණු | එකතුව |
| 1 | 1A | | | |
| | 1B | | | |
| | 1C | | | |
| | 1D | | | |
| | ---- | | | |
| | ---- | | | |
| 2 | 2A | | | |
| | 2B | | | |
| | 2C | | | |
| | 2D | | | |
| | ---- | | | |
| | ---- | | | |

1 සිට 13 දක්වා ඉහත සඳහන් අයුරින් වගුව සකසා එවන්න.

උසස්පෙළට අදාළව ඒ ඒ විෂයය ධාරාව අනුව වෙන වෙනම පන්ති සංඛ්‍යාව සඳහන් කළ යුතුය. තවද උසස් පෙළ පන්තිය සඳහන් කිරීමේදි විභාගයට පෙනී සිටින වර්ෂය වරහන් තුළ සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.
උදා:12 Bio (2019)

02. ආගම අනුව ශිෂ්‍ය සංඛ්‍යාව

| ආගම | 1-11 ශ්‍රේණි වල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ | |
| හින්දු | |
| ඉස්ලාම් | |
| කතෝලික | |
| ක්‍රිස්තියානි | |
| ......................... | |
| ......................... | |
| ......................... | |

03. විධිමත් පරිගණක විද්‍යාගාර සංඛ්‍යාව .........................

04. 10 -11ශ්‍රේණි වල උගන්වන කාණ්ඩ විෂයයන් සංඛ්‍යාව

කාණ්ඩ 1 -

කාණ්ඩ 2 -

කාණ්ඩ 3 -

05. (i). විශේෂ අධ්‍යාපන ඒකකයක් තිබේද? .........................

(ii). එසේ නම් එහි සිටින ශිෂ්‍ය සංඛ්‍යාව .........................

06. විධිමත් පුස්තකාලයක් තිබේද? ............................